# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2092/38 – 2018 ඔක්තෝබර් 10 වැනි බදාදා – 2018.10.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 246 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/476.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/ඉ/අත්පත්/91/2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, මල්ලවපිටිය.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 718 කෝවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහකෝවාන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේ්‍යු/එම්එල්එල්/2017/009 හා 2017. 02. 28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 46 – කෝන්ගොල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0105**

උතුරට: එච්. පී. රොසලින් හිමිකම් කියන කෝන්ගොල්ලවත්ත; නැගෙනහිරට: කැබලි අංක 45 සහ 56; දකුණට: කැබලි අංක 56; බටහිරට: කැබලි අංක 47 සහ එම්. ඩී. එම්. ඩී. සුමනපාල හිමිකම් කියන කෝන්ගොල්ලවත්ත.

10 – 1349